# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

ඒ. එම් රයිෂ් අහමඩ්
අංක 78,
බී. අල් හම්රා වීදිය,
මරුදමුනයි 04

**<u>අභියාචක</u>**

**අභියාචනා අංකය : 869/2021**

**එදිරිව**

ශ්‍රී ලංකා ටෙලිකොම්
සමාගම
ලෝටස් පාර
කොළඹ 01

**<u>පොදු අධිකාරිය</u>**

**ඉදිරිපිටදී** :

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** :

අභියාචක නැත.

පොදු අධිකාරිය වෙනුවෙන් නීති නිලධාරි රජිතා ද සිල්වා මිය පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** :

අභියාචක - ඉදිරිපත් කර නැත

පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත

**විභාග කළ දිනය** : 2022.05.20

**තීරණය කළ දිනය** : 2022.05.20

**<u>කොමිෂන් සභාවේ තීරණය</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 2021.02.26 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

*"2011 වෂර්යේ නොවැම්බර් මස උගත් පාඩම් සංහිදියාව කොමිෂන් සභාවෙන් රජයටත් මහ ජනතාවටත් යෝජනා කර තිබූ 8:196 අංක ඡේදයේ*

*" බොහෝ කාලයක් සිට ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාවලියට අත්‍යවශ්‍ය රජයේ ආයතනයන් තවදුරටත් ප්‍රබලවීමේ හේතුව නිසා ජනතාවගේ ස්වෛරියතාවය විටෙන් විට නම්‍ය වී පවතියි.*

*මෙය මා ලබා ගත බවට දන්වා:*

- ✓ *2020.05.21 අංක 9803 දරන ලියාපදිංචි ලිපියෙන් ඉදිරිපත් කළ නැවත පෙත්සම P1 යන හා*
- ✓ *2020.08.08 නැවත සිහිකැඳවීම නැවත පෙත්සම වෙනස් නොවන බවට තිබීමේ හේතුව කුමක්ද?*

මෙම තොරතුරු ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් තොරතුරු නිලධාරි විසින් 2021.03.15 පහත ප්‍රතිචාරය දක්වා ඇත.

*ඔබ විසින් ඉදිරිපත් කර ඇති 2021 පෙබරවාරි 26 දිනැති තොරතුරු ලබා ගැනීමේ අයදුම් පත්‍රයෙහි සඳහන් කර ඇති ඉල්ලීම, 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනතේ විෂය පථය යටතට නොවැටේ.*

*ඔබව යම් වැටුප් ශ්‍රේණියක පිහිටුවීමට අදාලව පැහැදිලි කිරීමක් ලබා ගැනීමට අවශ්‍ය නම් ඒ පිළිබඳව සෘජුවම මානව සම්පත් අංශයෙන් විමසන ලෙසට දන්වා සිටිමි.*

මෙයින් අතෘප්තියට පත් අභියාචක 2021.03.21 දින නම් කල නිලධාරි වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර නම් කළ නිලධාරි විසින් 2021.04.22 පහත ප්‍රතිචාරය දක්වා ඇත.

*ඔබගේ අයදුම්පත්‍රයෙන් බලාපොරොත්තු වන ඔබගේ සේවා නියුක්තිය සම්බන්ධ පැහැදිලි කිරීම් මේ පනතේ විෂය පථය යටතට නොවැටේ.*

*එසේ හෙයින් මීට පෙර ඔබ වෙත දැනුම් දී ඇති පරිදි අදාල පැහැදිලි කිරීම් මානව සම්පත් පෂර්දයෙන් ලබා ගැනීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි.*

මෙම පිළිතුරෙන් අතෘප්තියට පත් අභියාචක 2021.05.01 දින කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය සිදු කර ඇත.

**සළකා බැලීම**

අභියාචක අද දින පැමිණ නැත. ඔහු විමශර්නය සඳහා දිනයක් ආයාචනය කර ඇත. පොදු අධිකාරිය විමශර්නයට සහභාගි වී සිටී. පොදු අධිකාරිය ඉදිරිපත් කර ඇති කරුණු අනුව මෙම අභියාචනා විමශර්නය ඉදිරි දිනකට නැවත නියම කිරීමට අවශ්‍ය නොවන බව පැහැදිලිව පෙනී යයි.

අභියාචක විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු ඉල්ලීම පනතේ 43 වගන්තියේ අර්ථ නිරූපණය තුළ ගැණෙන තොරතුරු ඉල්ලීමක් නොවේ. මේ සම්බන්ධයෙන් පොදු අධිකාරියේ තොරතුරු නිලධාරි මෙන්ම නම් කළ නිලධාරිද ඔවුනොවුන් ඉදිරියේ මෙම ඉල්ලීම පැමිණි අවස්ථාවේදී තීරණය කර අභියාචක වෙත දැනුම් දී ඇත. එකී තීරණ හා එකග නොවී සිටීමට කිසිදු හේතුවක් අපට දෘෂ්‍යමාන නොවේ. එබැවින් මෙම කරුණු සළකා බලා නම් කළ නිලධාරිගේ තීරණයට එකඟ වෙමින් මෙම අභියාචනය නිෂ්ප්‍රභා කිරීමට තීරණය කරමු.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.